චක්‍රලේඛ අංක : 02/2007

මගේ අංකය: බප/සසේකො/ලේ.නිර්/2007
සමූපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.)
අංක 50, නිතුල්වත්ත පාර,
කොළඹ 08.
2007.01. 16

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමූපකාර සමිති,
ග්‍රාමීය බැංකු සංගම් හා ස.ණ.ස. සමිති වල
සභාපතිවරුන් වෙත.

**කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බඳවා ගැනීම.**

සුදුසු සේවකයින් අභ්‍යන්තරව හෝ බාහිරින් බඳවා ගැනීමට නොහැකි අවස්ථාවලදී සමූපකාර සමිති වලට කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බඳවා ගැනීමට සිදුව ඇත. එසේ බඳවා ගැනීමේදී ද සීමිත අයදුම්පත් සංඛ්‍යාවක් ලැබෙන බැවින් ඊට මුහුණ දීමට සිදුව ඇති නිසා එම තත්වයට පිළියම් වශයෙන් දිවයින තුළින්ම අයදුම්පත් කැඳවා කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බඳවා ගැනීමට 2007 වසර අවසානය දක්වා තාවකාලික පියවරක් වශයෙන් මෙයින් අවසර දෙනු ලබන අතර, එසේ බඳවාගත හැක්කේ පහත සඳහන් කොන්දේසි වලට යටත්වය.

(අ) සමිතිය තුළ අදාළ තනතුර සඳහා සුදුසුකම් සහිත සේවකයින් නොසිටීම

(ආ) සුදුසුකම් සහිත සේවකයින් සිටියත්, ඔවුන් අදාල තනතුර භාර ගැනීම ප්‍රතික්ෂේප කරන්නේ නම්, එබඳු සේවකයින් ඉදිරියේ ඇතිවන තිසිම උසස්වීමක් සඳහා සලකා නොබලන බවට ඔවුනට දැනුම් දී ඊට එකඟ බවට ඔවුනගේ එකඟතාවය ලිඛිතව ලබා ගෙන පුද්ගලික ලිපිගොනු වල ඇතුළත් කිරීම

(ඇ) වෙනත් සමිතියක සේවය කරන ලද අයකු නම් අදාළ දිස්ත්‍රික්කයේ සමූපකාර සංවර්ධන කොමසාරිස් වරයාගෙන් රහස්‍ය චාරිතාවක් ලබා ගැනීම. ඉන් යහපත් පූර්ව සේවාවක් සහිත බව සනාථ නොවන කිසිවකු බඳවා නොගත යුතුය. ,

(ඈ) අදාල ලිපිලේඛණ සමග සම්මුඛ පරීක්ෂණ වාර්තා මෙම කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබා ගැනීමට පෙර බඳවා ගැනීම නොකිරීම.

(ඉ) සමිතිය සමග අදාල සේවා කොන්දේසි ඇතුලත් ගිවිසුමකට බැඳීම.
නියමිත කාල සීමාව තුල හෝ එම කාල සීමාව අවසානයේදී හෝ පත්වීම අවසන් කිරීමට සමිතියට අයිතිය ඇති බවට කොන්දේසියක් විශේෂයෙන් ඇතුළත් විය යුතුය.

(ඊ) වැටුප විය යුත්තේ ඔවුන් විසින් අදාල සමිතියෙන් ලබා ගත් අවසන් වැටුප සහ මෙම කොමිෂන් සභාව විසින් අනුමත දීමනාය. අවසන් වරට ලබා ගත් තනතුරට අනුමත වැටුප (දීමනා රහිත) උපරිම වැටුපට වඩා වැඩි නම්, ගෙවිය හැක්කේ අනුමත උපරිම වැටුප හා අනුමත දීමනා පමණි.

(උ) වයස අවුරුදු 67 ට අඩු විය යුතුය.

02. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගත හැක්කේ පහත සඳහන් තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා පමණි.

... 2/

(1) සාමාන්‍යාධිකාරි
(2) ගණකාධිකාරි
(3) පිරිස් කළමණාකරු
(4) බැංකු සේවා කළමණාකරු
(5) අභ්‍යන්තර විගණක
(6) මූල්‍ය කලමණාකරු
(7) වාණිජ කළමණාකරු
(8) පිරිස් කළමණාකරු
(9) සහකාර බැංකු සේවා කළමණාකරු
(10) සාමාජික සම්බන්ධතා හා පුහුණු කිරීමේ නිලධාරි
(11) ග්‍රාමීය බැංකු කළමණාකරු
(12) වෙළඳසැල් පරිපාලක
(13) ඖෂධවේදී
(14) කාර්මික නිලධාරි
(15) ඖෂධ සංයෝජක
(16) රසායනාගාර ශිල්පී
(17) හෙද/හෙදි
(18) කාර්මික ශිල්පී
(19) බැංකු සහකාර
(20) බේකරිකරු
(21) වඩු කාර්මික
(22) ජල නල කාර්මික
(23) රියදුරන්
(24) අවමංගල මල් ශාලා කළමණාකරු
(25) එම්බාම්කරු

සමූපකාර සේවයෙන් පරිබාහිර සේවයක සිට කොන්ත්‍රාත් පදනම මත බඳවා ගන්නා සේවකයින්ගේ වැටුප තීරණය කිරීම සඳහා ඔවුන්ගේ නියමිත සුදුසුකම් දැක්වෙන සහතිකපත් හා සේවා සහතික කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කොට අනුමැතිය ලබාගත යුතු අතර, සමූපකාර සේවයේ නිරතව සිටි සේවකයින්ගේ වැටුප තීරණය කළ යුත්තේ ඉහත පළමු ඡේදයේ (ඉ) වගන්තිය යටතේය. කොමිෂන් සභා අනුමැතියෙන් තොරව කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම නොකළ යුතුය.

කොමිෂන් සභාවේ නියමය පරිදියි,

කේ. කේ. සිරිසේන,
ලේකම්,
සමූපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:- 1. බස්නාහිර පළාත් සමූපකාර හා පළාත්බාර් අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්
2. ප්‍රධාන ලේකම් (බ.ප.)
3. ලේකම්, සමූපකාර හා පළාත්බාර් අමාත්‍යාංශය (බ.ප.)